# 1.5 කෝලම් නාට්‍යයෙහි ව්‍යවහාරිත "ගත ගුම් " බෙර පදය පිළිබඳ කෙටි විමර්ශනයක්

ආර්.බී. රණවීර
නාට්‍ය, මුද්‍රා නාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

---

## ABSTRACT

ශ්‍රී ලාංකේය ගැමි නාට්‍ය අතරෙහි කෝලම් නාට්‍ය සම්ප්‍රදායට හිමි වනුයේ විශේෂ ස්ථානයකි. එහි නාට්‍යමය විශේෂතා පිළිබඳව සිදුකෙරෙමින් පවතින පුළුල් අධ්‍යයනයක දී හඳුනාගත් එක් පාර්ශවයක් පිළිබඳව තොරතුරු සාකච්ඡා කිරීම මෙම පර්යේෂණ සාරාංශයෙන් අරමුණු කෙරෙයි.

චරිත නිරූපණයෙහි ලා බෙරපද යොදා ගැනීමෙහි, සුවිශේෂතා හඳුනා ගැනීම එහි දී සිදු විය. එක් එක් චරිත රංග ගත කිරීම සඳහා විවිධ බෙරපද කෝලම් නාට්‍යකරුවා ව්‍යවහාර කොට ඇති අතර "ගත ගුම්...." තාලය/පදය නමින් ශිල්පීය ව්‍යවහාරික බෙර පදය සුවිශේෂ වන බැව් එහි දී පැහැදිලි විය. මුදලි කෝලම, ගිරිදේවි සබනැටුම, නාගකන්‍යා සබනැටුම, ආදී අංගයන්හි රංගවින්‍යාසයේදී මෙම බෙර පදය යෙදී ඇති බව දැකිය හැකිය.

එකිනෙකට සම නොවන සංකල්ප මත ගොඩනැගී ඇති ඉහත චරිතයන්හි ගති ලක්ෂණ වෙනස්ය. උක්ත බෙර පදය යොදා ගනිමින් එකී වෙනස් ගති ලක්ෂණ නිරූපණය කිරීමේදි අනුගමනය කෙරෙන ශිල්පීය ක්‍රමවේද හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ විය.